# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 මැයි මස 13 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016. 05. 16 දින නිකුත් කරන ලදී)**

## ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 11.00 තැපැල් ගාස්තුව : රු. 10.00

# ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD)" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එම සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එම සංගමය හා සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ බැවින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ සංගමය විසින් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක  දරන ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ළමා සංවර්ධන (SLACD) සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින්නා වූ සියලුම තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංගමයට මින්මතු සාමාජිකයන් වශයෙන් මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD)" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංගමයක් විය යුතු අතර, ඒ සංගමය විසින් හා ඊට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංගමයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංගමය පිහිටුවනු ලබන පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේ:—

(අ) ළමා සංවර්ධනය පිළිබඳ වෘත්තීයමය දැනුම සහ නිපුණතා දියුණු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම;

2—PL 009829 -300 (2016/03)

(ආ) ළමා සංවර්ධනය සහ වර්ධන රෝග පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම;

(ඇ) ළමා සංවර්ධනය සහ වර්ධන රෝග ඇති ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම;

(ඈ) වර්ධන රෝග ඇති ළමුන්ගේ සහ පොදුවේ ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවිතයේ ගුණාත්මක බව දියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම;

(ඉ) SLACD හි අරමුණ වන්නේ ළමා සංවර්ධනය පිළිබඳ වෘත්තීමය දැනුම සහ නිපුණතා දියුණු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම;

(ඊ) ළමා සංවර්ධනය සහ වර්ධන රෝග පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම; සහ

(උ) මේ අනුව, SLACD ක්‍රියාකාරී කමිටුව තීරණය කරන ක්‍රියාකාරකම් මගින් ළමා සංවර්ධනය සහ වර්ධන රෝග ඇති ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම, වර්ධන රෝග ඇති ළමුන්ගේ සහ පොදුවේ ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවිතයේ ගුණාත්මක බව දියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම සිදු කෙරේ.

ඉහත සඳහන් අරමුණු සම්පූර්ණ කර ගැනීම සඳහා SLACD මගින් මූල්‍යමය හා වෙනත් ආකාරයේ පරිත්‍යාග සහ තෑගි භාර ගැනීම, පරිහරණය කිරීම හා ළඟ තබා ගැනීම සිදු කෙරේ.

SLACD සැම විටම ක්‍රියා කරන්නේ ඉහත දැක්වූ අරමුණු සඳහා පමණක් සහ කිසිවෙකුටත් ආසාධාරණයක් නොවන පරිදි වන අතර, එහි සාමාජිකයන් හෝ නිලතල දරන්නන් හෝ පුද්ගලික පාක්ෂිකයකු අදාළ සම්පත්වලින් ලාභ ප්‍රයෝජන ගැනීම හෝ බෙදගැනීම නොකළ යුතුයි. එහෙත් ලබා ගත් සේවාවන් සඳහා සුදුසු ගෙවීමක් කිරීමට සහ ඉහත සඳහන් අරමුණ ඉටුකර ගැනීම සඳහා ගෙවීම් සහ බෙදදීම් කිරීමට SLACD ට බලය තිබේ. තව ද, මෙම අතුරු නීතියට අදාළ වෙනත් විධිවිධාන තිබුණ ද, ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ආයතනයකට ඉඩ නොදෙන කිසිම ක්‍රියාවලියක් SLACD මගින් නොකෙරේ. තව ද SLACD හි අභිප්‍රාය ඉදිරියට ගෙනයාමට පටහැනි ක්‍රියාවලියක් හෝ බලය පාවිච්චි කිරීමක් නොකෙරේ.

SLACD සහ එහි සාමාජිකයන් විසින් සේවාවක් ලබා දෙන පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල්වල ජීවිතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් පෙනී සිටීම SLACD හි අරමුණුවලට අනුකූලව සිදු කෙරේ. මහජන සේවය සඳහා ඉදිරිපත් වන දේශපාලන අපේක්ෂකයකු වෙනුවෙන් සහභාගි වීම හෝ මැදිහත් වීම (ප්‍රචාරක පත්‍රිකා සහ නිවේදන නිකුත් කිරීම ඇතුළු) SLACD මගින් නොකෙරේ. සෑම ක්‍රියාවලියක්ම 2 වගන්තියේ 2 කාණ්ඩයේ දක්වා ඇති සීමාවන් ඉක්මවා නොයා යුතුය.

සාමාජිකත්වය.

**4.** (1) සාමාජිකයන් වර්ග 5කි. යාවජීව සාමාජිකයන්, සාමාන්‍ය සාමාජිකයන්, විදේශ සාමාජිකයන්, ගරු සාමාජිකයන් සහ සහකාර සාමාජිකයන්. සෑම සාමාජිකයෙකුටම රැස්වීම්වලට සහභාගි වීමේ අයිතිය තිබේ. සහකාර සාමාජිකයන් හැර අන් සියලු සාමාජිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත. නිලතල දැරීමේ අයිතිය SLACD යාවජීව සාමාජිකයින්ට සහ සාමාන්‍ය සාමාජිකයන්ට සීමා වේ. සාමාන්‍ය සාමාජිකයින්, විදේශ සාමාජිකයින් සහ සහකාර සාමාජිකයින්ගේ වාර්ෂික සාමාජික ගාස්තුව නිලධාරි කවුන්සිලය මගින් තීරණය කෙරෙන අගයන් වේ. වරක් පමණක් ගෙවන යාවජීව සාමාජික ගාස්තුව ද තීරණය කරන්නේ ද නිලධාරි කවුන්සිලය විසිනි.

(2) සාමාන්‍ය සාමාජිකයින් සහ යාවජීව සාමාජිකයින්ට සාමාජිකත්වය දැරීමට තිබිය යුතු සුදුසුකම්:—

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;

(ආ) පශ්චාත් වෛද්‍ය උපාධිධාරි, තම වෘත්තියමය කටයුතුවල දී ළමා සංවර්ධනය සහ ළමා වර්ධන රෝග පිළිබඳ කැපවීමක් හා නිපුණතාවක් දක්වන SLACD හි අරමුණුවලට අනුකූල වෘත්තීයමය කටයුතුවල යෙදෙන වෛද්‍යවරයෙක් විය යුතු ය;

(ඇ) සුදුසු පශ්චාත් උපාධියක් ඇති, තම වෘත්තීයමය කටයුතුවලදී ළමා සංවර්ධනය සහ ළමා වර්ධන රෝග පිළිබඳ කැපවීමක් හා නිපුණතාවයක් දක්වන SLACD හි අරමුණුවලට අනුකූල වෘත්තීයමය කටයුතුවල යෙදෙන වෙනත් පුද්ගලයෙකු විය යුතුය;

(ඇ) උපාධියක් ඇති සහ බලපත්‍රලාභීන්, තම වෘත්තීයමය කටයුතුවල දී ළමා සංවර්ධනය සහ ළමා වර්ධන රෝග පිළිබඳ කැපවීමක් හා නිපුණතාවක් දක්වන SLACD හි අරමුණුවලට අනුකූල වෘත්තීයමය කටයුතුවල යෙදෙන වෙනත් පුද්ගලයකු විය යුතුය. (දැනට සේවය කරන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශය ලබා ගත යුතුයි)

*ගරු සාමාජිකයින්.—* ගරු සාමාජිකයෙක් වෛද්‍ය වෘත්තියේ යෙදෙන හෝ අදාළ විද්‍යාත්මක ක්ෂේත්‍රයක යෙදෙන කෙනෙක් විය යුතුය. SLACD හි ගරු සාමාජිකයෙක් ලෙස තෝරා ගන්නා ලද්දේ එම පුද්ගලයාගේ ළමා සංවර්ධනය සහ ළමා වර්ධන රෝග පිළිබඳ දක්වා ඇති විශේෂ නිපුණත්වය හා අධ්‍යයන කටයුතු මතය.

*විදේශ සාමාජිකයින්.—* විදේශ සාමාජිකයින් වන්නේ වෛද්‍ය වෘත්තියේ හෝ වෙනත් විද්‍යාත්මක ක්ෂේත්‍රයක ආචාර්ය පදවියක සේවය කරන, ළමා සංවර්ධනය සහ ළමා වර්ධන රෝග පිළිබඳ කැපවීමක් හා නිපුණතාවක් දක්වන SLACD හි අරමුණුවලට අනුකූල වෘත්තියමය කටයුතුවල යෙදෙන, ශ්‍රී ලාංකික පුරවැසියෙකු නොවන්නෙකු විය යුතු ය.

*සහකාර සාමාජිකයින්.* — සහකාර සාමාජිකයින් පශ්චාත් උපාධිය සඳහා පුහුණුව ලබන වෛද්‍යවරුන් විය යුතු ය.

(3) සාමාජිකත්වය සඳහා සියලුම ඉල්ලුම් කිරීම් SLACD කවුන්සිලය මගින් අනුමත කළ ඉල්ලුම් පත්‍රයක් පුරවා SLACD ලේකම් හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයෙක් වෙත ඉදිරිපත් කළ යුතුය. කාණ්ඩය 4(3) දක්වා ඇති පරිදි, ඉල්ලුම් පත්‍රය සමග අදාළ නිලධාරියෙකුගේ අනුමැතිය තිබිය යුතු ය. ලේකම් විසින් එක් එක් ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර, සාමාජිකත්වය ලැබීමට සුදුසුකම SLACD හි කවුන්සලයට නිර්දේශ කරනු ඇත. අවසාන තීරණය SLACD කවුන්සිලය සතු ය.

(4) SLACD කවුන්සිලය මගින් සාමාජිකත්වය සඳහා නිර්දේශ කරන ලද නාමයෝජනාවකට සාමාජිකයින් එක් කෙනෙක් හෝ ඊට වැඩි ගණනක් විරුද්ධ වුවහොත්, එසේ කිරීමට හේතු විරුද්ධ වන පාර්ශ්වය ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කවුන්සිලය මගින් ඉල්ලා

සිටිනු ඇත. දින 30ක් ඇතුළත ප්‍රතිචාරයක් නොලැබුණහොත්, විරෝධය අහෝසි වනු ඇත. ලිඛිත විරෝධයක් ඉදිරිපත් වුවහොත්, කවුන්සිලය ඒ පිළිබඳ සාධාරණ ලෙස සභාපතිගේ අනුදැනුම ඇතිව සළකා බලනු ඇත. එම විරෝධය SLACD කවුන්සිලය මගින් ප්‍රතික්ෂේප කිරීම හෝ සාමාජිකයාට එම විරෝධය සුදුසු ලෙස ප්‍රතිචාරයක් දැක්වීමට අවස්ථාවක් ලබා දීම කෙරෙනු ඇත. කරුණු කෙසේ වුවත්, ලේකම්ට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට ඉදිරිපත් කළ සාමාජිකත්වය සඳහා කෙරෙන ඉල්ලුමක් දින 120 ඇතුළත පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප වීම සිදු වනු ඇත.

(5) SLACD සාමාජිකයින්ගේ වාර්ෂික රැස්වීම පවත්වන දිනය සහ ස්ථානය තීරණය කරනු ලබන්නේ SLACD කවුන්සිලය මගිනි. එවැනි රැස්වීමක් පවත්වන්නේ එවැනි රැස්වීමක දී ඉදිරිපත් විය යුතු ගනුදෙනු සහ කාර්යය සඳහාය. වාර්ෂික රැස්වීමට හැකි තරම් දුරට විද්‍යාත්මක අංශයක් ද අඩංගු කරනු ඇත. නව සාමාජිකයන් හඳුන්වා දීම වාර්ෂික රැස්වීමේ දී සිදු වනු ඇත.

(6) SLACD කවුන්සිලයේ බහුතරයකගේ ඉල්ලීම මත හෝ 15 ට වැඩි SLACD සාමාජිකයින්ගේ ඉල්ලීම මත SLACD සභාපති විසින් විශේෂ රැස්වීම් කැඳවනු ලැබේ.

(7) SLACD සාමාජිකයින්ගේ රැස්වීම් පිළිබඳ ලිඛිත හෝ මුද්‍රිත දැන්වීමක් දිනය හා පැවැත්වෙන ස්ථානය සඳහන් කර, විශේෂ රැස්වීමක් නම් එය පැවැත්වීමට හේතුව සඳහන් කර, රැස්වීමට දින පහකට (5) නොඅඩු කාලයක් සහ දින හැටකට (60) නොවැඩි කාලයක් තුළ සෑම සාමාජිකයෙක් වෙත පුද්ගලිකව හෝ තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු ය. තැපෑලෙන් යවන ලද නම් SLACD නාමලේඛනයේ දැක්වෙන අලුත්ම ලිපිනය සඳහන් කර, ශ්‍රී ලංකා තැපැල් සේවයට බාරදුන් විට එම දැන්වීම සාමාජිකයා වෙත යවන ලද එකක් සේ සලකනු ලැබේ.

(8) ගනුදෙනු සහ කටයුතු සඳහා පැවැත්වෙන SLACD සාමාජිකයන්ගේ රැස්වීමක ගණපූරණය ඡන්දය ප්‍රකාශ කළ හැකි, නාම ලේඛනයේ සඳහන් සාමාජිකයින්ගේ අවම වශයෙන් සියයට දහයක (10% ) ප්‍රතිශතයක්, SLACD කවුන්සිලයේ බහුතරයක් ඇතුළුව විය යුතු ය. ගණපූරණයක් ඇති, නියම ලෙස ප්‍රකාශයට පත් කර පවත්වන රැස්වීමක දී, සාමාජිකයින් වැඩි සංඛ්‍යාවකගේ එකඟත්වයෙන් රැස්වීම අතරතුර ගනු ලබන සෑම පනතක් හා තීරණයක්ම SLACD සාමාජිකයන්ගේ වළංගු පනතක් සේ සලකනු ලැබේ. ගණපූරණයක් ඇති, නියම ලෙස ප්‍රකාශයට පත්කර පවත්වන

රැස්වීමකට සහභාගි වන සාමාජිකයින්ට එතැන් සිට වෙනත් ගනුදෙනු හා කටයුතු ඇත්නම්, ගණපූරණයට අඩු සාමාජික සංඛ්‍යාවක් සිටියත් රැස්වීමේ නිමාව දක්වා කරගෙන ගිය හැක.

(9) අවශ්‍ය ක්‍රියාමාර්ගයක් හෝ SLACD සාමාජිකයින් විසින් ගැනීමට අවසර දුන් ක්‍රියාමාර්ගයක්, නීතිය හෝ මෙම අතුරු නීති යටතේ රැස්වීමක් නොපවත්වා ක්‍රියාත්මක කළ හැක. ඒ සඳහා සියලුම සාමාජිකයින්, තනි තනිව හෝ කණ්ඩායමක් ලෙස එම ක්‍රියාමාර්ගය සඳහා ලිඛිතව අනුමැතිය දිය යුතුය. එම ලිඛිතව අනුමැතිය හෝ අනුමැති සාමාජිකත්වයේ රැස්වීම වාර්තාවලට ඇතුළත් විය යුතු යි. ලිඛිතව දෙනු ලබන අනුමැති සාමාජිකත්වයේ ඒකමතික ඡන්දයක් හා සමාන බලයක් ඇත.

(10) සියලුම සාමාජිකයිනගේ නම්, සහකාර සාමාජිකයන්, ගරු සාමාජිකයන්, විදේශීය සාමාජිකයින්, ඇතුළුව නාමලේඛනයකට ඇතුළත් කර ලේකම්වරුන් විසින් පවත්වාගෙන යනු ලැබේ. ගනුදෙනු සඳහා නිවැරදි ලිපිනයක් ලේකම්වරුන්ට ලබා දීමත්, එහි වෙනසක් වුවහොත් වහාම දන්වා සිටීමටත්, සියලු සාමාජිකයන්ගේ වගකීමකි.

සාමාජිකත්වය අහිමි කිරීම.

**5.** (1) SLACD කවුන්සිලයේ අනුමැතියකින් ඕනෑම වර්ගයක ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය SLACD වාර්ෂික රැස්වීමට සහභාගී වන සාමාජිකයන්ගේ හතරෙන් තුනක (3/4) ඡන්දයෙන් අහෝසි කළ හැක. ඔහුට/ඇයට විරුද්ධ චෝදනා සහ විශේෂ වේලාවක සහ ස්ථානයක දී කවුන්සිලය මගින් සිදු කරන ලද නඩු විභාගය පිළිබඳ ලිඛිත පත්‍රිකාවක් මගින් පුද්ගලිකව හෝ තැපෑලෙන් ඔහුගේ/ඇයගේ අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයට, එම නඩු විභාගයේ සිට දින 90කට නොඅඩු කාලයක් තුළ දැනුම් දී තිබිය යුතු ය. තව ද, එම චූදිත සාමාජිකයාට SLACD කවුන්සිලය ඉදිරියේ තම නිදෙස් බව ප්‍රකාශ කිරීමට අයිතිවාසිකමක් ඇත.

(2) යම් සාමාජිකයෙක් පවත්නා වර්ෂයට සාමාජික ගාස්තු මාර්තු 31 වන විට ගෙවා නැත්නම් ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය කෙලවර කරනු ලැබේ. ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය නැවත ලබා දීමට නම් වාර්ෂික දඩ මුදලකුත් එම වර්ෂයට අදාළ ගාස්තුවත් ගෙවිය යුතු ය.

(3) හොඳ ස්ථාවරයක සිටින සාමාජිකයකු වසර දෙකට නොවැඩි කාලයක් නොපැමිණීමට කවුන්සිලයෙන් අවසර ඉල්ලා සිටිය හැක. මෙම අවසරය ඉල්ලා සිටින කාලය තුළ එම සාමාජිකයාගෙන්

ගාස්තු ලබා නොගැනීමට කවුන්සිලයට තීරණය කළ හැක. නොපැමිණෙන කාලය තවදුරටත් දික් කිරීමට හැකි වන්නේ සාමාජිකයාගේ ඉල්ලීම පිළිබඳ කවුන්සිලය ගන්නා තීරණය මතය.

පොදු බලතල.

**6.** (1) අතුරු නීති කිසිවක් බලපාන අවස්ථා හැර SLACD බලතල ක්‍රියාත්මක කිරීම, දේපළ පාලනය කිරීම, එහි කටයුතු හැසිරවීම යන සියල්ල SLACD කවුන්සිලය මගින් සිදු කෙරේ.

(2) SLACD කවුන්සිලය සාමාජිකයින් පහළොවකින් සමන්විත වේ. ඡන්දයෙන් පත් කළ ගණන හතකි (7). සභාපති, උපසභාපති, ඊළඟ සභාපති, ලේකම්වරුන් දෙදෙනා, භාණ්ඩාගාරික, නියෝජ්‍ය භාණ්ඩාගාරික, අන්තිමට සිටි SLACD සභාපතිවරුන් දෙදෙනා (2) පොදු SLACD සාමාජිකයින් අතුරින් සාමාජිකයින් හතරක් (4) මෙයින් තුන් දෙනෙක් (3) ළමා රෝග වෛද්‍ය විශේෂඥ, ළමා සහ යොවුන් මනෝවෛද්‍ය විශේෂඥ සහ සහකාර සෞඛ්‍ය සේවක යන අංශවලින් එක්කෙනා බැගින් විය යුතුයි. ඡන්දය දීමට නොහැකි දෙදෙනෙක් (2) ළමා රෝග පිළිබඳ වෛද්‍යවරුන්ගේ සංගමය සහ ප්‍රජා දෛද්‍යවරුන්ගේ සංගමය නියෝජනය කරයි.

(3) සාමාජිකයන්ගේ වාර්ෂික රැස්වීමේ දී මෙම සාමාජිකයින් පහළොස්දෙනාගේ නම් යෝජනා කර පොදු සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තෝරා ගනු ලබයි. ඡන්දය නොදෙන සාමාජිකයින් දෙදෙනා යෝජනා කෙරෙන්නේ ළමා රෝග පිළිබඳ වෛද්‍යවරුන්ගේ සංගමය සහ ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමය මගිනි.

(4) SLACD කවුන්සිලයේ සාමාජිකයින් වසර දෙකක (2) කාලයක් සඳහා තෝරා ගනු ලබයි. එම නිල කාලය අවසානයේ කිසිවෙක් නැවතත් එම නිලයටම පත් නොවිය යුතුයි.

(5) ඕනෑම SLACD නිලයකට තරග කරන්නෙක් අවම වශයෙන් වසර දෙකක් (2) සාමාජිකත්වය දරා සිටි කෙනෙක් විය යුතුයි.

(6) SLACD කවුන්සිලයේ ඕනෑම ඡන්දයෙන් පත් වූ නිලධාරියෙක් කවුන්සිලයේ වැඩි ඡන්දයකින් ඕනෑම රැස්වීමක දී ඉවත් කළ හැක. එක් නිලධාරියෙක් හෝ ඊට වැඩි ගණනක් මෙසේ ඉවත් කළ අවස්ථාවක දී අලුතින් නිලධාරීන් ඉවත් කළ නිලධාරියාගේ ඉතිරි නිල කාලය සඳහා ඡන්දයෙන් පත් කිරීම එම රැස්වීමේ දී ම කළ හැක.

(7) කවුන්සිලයේ නිලධාරීන්ගේ ඇති වන පුරප්පාඩු මෙහි ඇතුළත් අතුරු නීතියට අනුව ඉතිරි කවුන්සිලයේ නිලධාරින්ගෙන් පියවිය හැකි අතර, එසේ කිරීම වාර්ෂික රැස්වීමේ දී හෝ විශේෂ රැස්වීමක දී කළ හැකි. එම පුරප්පාඩුව පිරවීම ඉතිරි නිල කාලය සඳහා පමණි.

(8) SLACD කවුන්සිලය අවම වශයෙන් මාස දෙකකට (2) වරක් රැස්විය යුතුයි. එම රැස්වීම, එම රැස්වීමට ඉදිරිපත්වන ගනුදෙනු සහ කටයුතු සඳහා වේ. කවුන්සිලයේ වෙනත් රැස්වීම්වල වේලාව සහ ස්ථානය සභාපතිගේ නියමය මත සිදු වේ. එම රැස්වීම් ගැන දින 14ක පූර්ව දැන්වීමක්, දිනය සහ ස්ථානය සඳහන්ව එක් එක් නිලධාරියාට ලබා දිය යුතුයි.

(9) ගනුදෙනු කටයුතු සඳහා ගණපූරණයට දැනට නිලතල දරන SLACD කවුන්සිලයේ සාමාජිකයන් බහුතරයක් සිටිය යුතු ය. නියම ලෙස කැඳවනු ලැබූ ගණපූරණය සහිත රැස්වීමක දී කවුන්සිලයේ සාමාජිකයන් බහුතරයක් පැමිණ සිටින විට ගනු ලබන සෑම පනතක් සහ තීරණයක්ම කවුන්සිලයේ වලංගු පනතක් ලෙස සලකනු ඇත.

(10) SLACD කවුන්සිලයේ සාමාජිකයන් විසින් ඕනෑම රැස්වීමක කරනු ලබන ගනුදෙනු කටයුතු ගණපූරණයක් තිබුණේ නම් හෝ රැස්වීමට පෙර හෝ පසුව පැමිණ නොසිටි කවුන්සිලයේ එක් එක් සාමාජිකයන් අත්හැරීමේ ලිපියක් හෝ රැස්වීම තැබීමට එකඟව හෝ රැස්වීමේ වාර්තාවට එකඟව අත්සන් කළේ නම් වලංගු වේ. එවැනි අත් හැරීමේ ලිපි, එකඟතාවන් හා අනුමැති සියල්ලම එම රැස්වීමේ වාර්තාවේ අංගයක් ලෙස ලිපි ගොනුගත කරනු ලැබේ.

(11) ඕනෑම නීතියක විධිවිධාන යටතේ SLACD කවුන්සිලය විසින් ගැනීමට අවශ්‍ය හෝ අවසර ඇති ක්‍රියාමාර්ග රැස්වීමක් නොපවත්වා කවුන්සිලයේ සියලු සාමාජිකයින් තනි තනිව හෝ සාමූහිකව ලිඛිත එකඟතාව දීමෙන් ගත හැකිය. එවැනි ලිඛිත එකඟතාවය SLACD වාර්තාවල අංගයක් ලෙස ලිපි ගොනුගත කරනු ලැබේ. එවැනි ලිඛිත එකඟතාවකින් ගන්නා ක්‍රියා මාර්ගවලට කවුන්සිලයේ සාමාජිකයන්ගේ ඒකමතික ඡන්දය හා සමාන බලයක් ඇත.

(12) SLACD කවුන්සිලයේ විශේෂ රැස්වීම් සභාපති හෝ කවුන්සිලයේ සාමාජිකයින් බහුතරයක් විසින් කැඳවිය හැක. එසේ කැඳවන පුද්ගලයා හෝ පුද්ගලයින් විසින් රැස්වීම පවත්වන වේලාව සහ ස්ථානය සඳහන් කෙරෙයි.

(13) SLACD කවුන්සිලයේ රැස්වීම පවත්වන වේලාව සහ ස්ථානය ලිඛිත දැන්වීමක් මගින් එක් එක් කවුන්සිලයේ සාමාජිකයින් වෙත පුද්ගලිකව හෝ තැපෑලෙන් හෝ වෙනත් සන්නිවේදන මාර්ගයකින් කලින් මුදල් ගෙවා SLACD නාම ලේඛනයේ සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. එවැනි සටහනක් නාම ලේඛනයේ නැත්නම් හෝ ඉක්මනින් දැනගත නොහැකි නම් දැන්වීම සාමාන්‍යයෙන් කවුන්සිලයේ රැස්වීම් පවත්වන ස්ථානයට යවනු ලැබේ. එවැනි දැන්වීම් යවනු ලබන්නේ අවම වශයෙන් රැස්වීම් පවත්වන වේලාවට පැය 72කට කලිනි.

(14) ගනුදෙනුවක් පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගනු ලැබූ SLACD කවුන්සිලයේ රැස්වීමකට පැමිණ සිටින කවුන්සිලයේ සාමාජිකයෙක් එම ක්‍රියාමාර්ගයට නිශ්චිතව එකඟ වූ ලෙස සැලකේ. එම ක්‍රියාමාර්ගයට විරෝධය ප්‍රකාශ කළේ නම් හෝ එම විරෝධය රැස්වීම නිම වීමට පෙර ලිඛිතව රැස්වීමේ ලේකම්ට බාර දුනහොත් එය රැස්වීමේ වාර්තාවට ඇතුළත් කළ යුතුයි. විරුද්ධ වීමේ අයිතිය ක්‍රියාමාර්ගයට එකඟව ඡන්දය ප්‍රකාශ කළ අයට නැත.

(15) සෑම SLACD නිලධාරියෙක්ම SLACD පොදු සාමාජිකත්වයේ වැඩි ඡන්දයෙන් වාර්ෂික රැස්වීමේ දී තෝරා ගනු ලැබේ.

(16) එම SLACD නිලධාරියා කිසිවෙකුට නැවත එම නිලයටම පත් වීම සඳහා ඉදිරිපත් විය නොහැක. දැනට සිටින සභාපති වෙනුවට පත් වන්නේ ඊළඟට තෝරා ගත් සභාපතිය.

SLACD සභාපති, ප්‍රධාන විධායක නිලධාරියා, වන අතර සහ කවුන්සිලයේ අධීක්ෂණයට යටත් වන අතර, පොදු කටයුතු පිළිබඳ අධීක්ෂණය කිරීම සහ මග පෙන්වීම සිදු කරයි. සභාපති, SLACD කවුන්සිලයේ සෑම රැස්වීමකම මුලසුන දරන අතර, ඔහු/ඇය විසින් කවුන්සිලය මගින් විටින් විට ගන්නා තීරණ අනුව වෙනත් යුතුකම් හා වගකීම් ද පැවරේ. වෙනත් සංස්ථාවක SLACD විසින් භුක්ති විඳින කොටස් පිළිබඳ කැමැත්ත දීමට සභාපතිට හැකි ය. ඔහුට/ඇයට පවත්නා කමිටු සියල්ලේම නිල බලයෙන් සාමාජිකත්වය සහ ඡන්දය දීමට බලය තිබෙන අතර කවුන්සිලය නිර්දේශ කරන ලද හෝ මෙම අතුරු නීතිය යටතේ පොදු බලතල හා යුතුකම් ඇත. සභාපති MD හෝ PhD උපාධියකින් සමන්විත විය යුතුයි.

(17) SLACD සභාපති නොසිටින විට හෝ ක්‍රියා කිරීමට නොහැකි විට, SLACD උපසභාපති විසින් සභාපතිට අයත් යුතුකම් ඉටු කළ යුතු ය. මෙසේ වැඩ බලන විට සභාපතිට අදාළ සියලු බලතල හා සීමාවන් උපසභාපතිට ද බලපානු ඇත. උපසභාපති MD හෝ PhD උපාධියකින් සමන්විත විය යුතුයි.

SLACD ලේකම් විසින් —

(අ) කවුන්සිලයේ රැස්වීම්වල සටහන් සහ වාර්තා තැබිය යුතුයි;

(ආ) සියලු දැන්වීම් නීත්‍යානුකූලව හෝ අතුරු නීතිවලට අනුව නියම ලෙස ලබා දීම කළ යුතුයි;

(ඇ) ලේකම්ගේ නිලයට අදාළ සියලු යුතුකම් සහ විටින් විට SLACD සභාපති විසින් බාර දෙනු ලබන වෙනත් යුතුකම් ද ඉටු කළ යුතුයි.

(18) SLACD භාණ්ඩාගාරික විසින් දේපළ සහ කටයුතු ගනුදෙනු පිළිබඳ ප්‍රමාණවත් සහ නිවැරදි ගිණුම් තැබීම සහ නඩත්තු කිරීම හෝ ගිණුම් තැබීම සහ නඩත්තු කරවීම කළ යුතුය. වත්කම්, බැරකම්, ආදායම්, වියපැහැදම්, ලාභ, පාඩු පිළිබඳ ගිණුම් ඇතුළුව ගිණුම් පොත් කවුන්සිලයේ ඕනෑම සාමාජිකයකුට පරීක්ෂා කිරීමට විවෘතව තැබිය යුතුය. භාණ්ඩාගාරික විසින් SLACD අයත් මුදල් සහ වටිනා ද්‍රව්‍ය SLACD කවුන්සිලයේ සාමාජිකයන් විසින් නම් කරන ලද තැන්පතුවක තැන්පත් කළ යුතුය. භාණ්ඩාගාරික විසින් අරමුදල් වැය කිරීම කවුන්සිලයේ නියෝගයට අනුව සිදු කළ යුතුය.

භාණ්ඩාගාරික විසින් කරන ලද ගනුදෙනු පිළිබඳ ගිණුම් සියල්ලම සහ කවුන්සිලයේ මූල්‍යමය තත්ත්වය පිළිබඳව සභාපති හෝ කවුන්සිලය ඉල්ලා සිටියොත් ඉදිරිපත් කළ යුතුය. භාණ්ඩාගාරික විසින් අරමුදල් වැය කිරීම කවුන්සිලයේ නියෝගයට අනුව සිදු කළ යුතුය. මුදල් වැය කිරීමට අදාළ නියම වවුචර භාවිතා කළ යුතුය. භාණ්ඩාගාරික හට සභාපති හෝ කවුන්සිලය විසින් බාර දෙනු ලබන වෙනත් යුතුකම් ඉටු කිරීම සඳහා බලය තිබේ.

(19) ඕනෑම SLACD නිලධාරියෙක් SLACD කවුන්සිලයේ තුනෙන් දෙකක (2/3) ඡන්දයෙන් එම නිලයෙන් ඉවත් කළ හැක. කිසියම් හේතුවක් නිසා රැස්වීම් අතර කාලයේ ඇති වන නිලධාරීන්ගේ පුරප්පාඩු කවුන්සිලයේ ඡන්ද විමසීමකින් පිරවිය හැක.

කමිටු.

**7.** SLACD විධායක කමිටුව ඡන්දයෙන් තෝරා ගනු ලැබූ නිලධාරීන් 7 දෙනෙකුගෙන් සහ නිල බලය ලත් නිලධාරීන් දෙදෙනකුගෙන් සමන්විතය. මුලසුන සභාපති විසින් දරනු ලැබේ. SLACD කවුන්සිලයේ රැස්වීම් අතර කාලයේ ඇති වන හදිසි කටයුතු හෝ කවුන්සිලය විසින් යොමු කළ කටයුතු පිළිබඳ තීරණ විධායක කමිටුව මගින් ගනු ලබයි. කමිටුව ගන්නා ක්‍රියාමාර්ග SLACD කවුන්සිලය මගින් ස්ථිර කළ යුතු යි. SLACD හි කටයුතු සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ස්ථාවර කමිටු, අවශ්‍යතාව අනුව ඡන්දයෙන් තෝරා ගැනේ හෝ කවුන්සිලය මගින් පත් කෙරේ.

සියලු SLACD කමිටු, වෙනත් නිර්දේශයක් SLACD කවුන්සිලය විසින් දී ඇති අවස්ථා හැර, කෙළින්ම කවුන්සිලයට වාර්තා කළ යුතු යි.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතුය.

(2) සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතුය.

(3) මේ පනත් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේදී හා ඉටු කිරීමේදී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

සංස්ථාවේ ගිණුම්.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම්, වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව යථා පරිදි ගිණුම් තැබීමට සංස්ථාව කටයුතු සැලැස්විය යුතුය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතුය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්:—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේදී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ එසේ කිරීමට පෙර හෝ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් එවැනි ආයතනයන් තීරණය කළ යුතුය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතුය.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සිංහල හෝ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවකදී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.